රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 12/90.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන්,
පළාත් පාලන දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සහ පුහුණු ආයතන ප්‍රධානීන් වෙත.

## ජාතික රාජ්‍ය සේවා පුහුණු ප්‍රතිපත්තිය

සියලුම රාජ්‍ය ආයතනවල පළාත් සභා, රාජ්‍ය සංස්ථා සහ පළාත් පාලන ආයතනවල ජාතික රාජ්‍ය සේවා පුහුණු ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රකාශනයක් (අමුණා ඇති පරිදි) ක්‍රියාත්මක කළයුතු යැයි රජය ප්‍රකාශයට පත්කොට ඇත. ජාතික සංවර්ධනය හා සුභසාධනය සපුරා ගැනීමේ අරමුණින් කළමනාකරන පරිසරය වර්ධනය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තිය සැලසුම්කොට ඇත. එහි අන්තර්ගත පුළුල් ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කළපසු රජයේ කටයුතු කරගෙන යාමේදී කළමනාකරන හැකියාව රාජ්‍ය අංශ ක්‍රියාකාරකම් සහ කළමනාකරන මෙහෙයුම් ක්‍රියාවන් වැඩිදියුණු විය යුතුය.

02. අදාල සියලුම ආයතන මගින් දිවයින පුරා ව්‍යාප්ත සේවාවල, පළාත් සභා සේවාවල සහ මධ්‍යම සේවාවල කාර්ය මණ්ඩලයන් වලදායී අන්දමින් පුහුණු කිරීම තහවුරු කිරීම සඳහා පියවර ගැනීමට ජාතික පුහුණු ප්‍රතිපත්තිය මගින් බලය ලබාදේ. විවිධ කොට්ඨාශවල රාජ්‍ය සේවකයින් සම්බන්ධයෙන් ජාතික පුහුණු ක්‍රමයක් පුහුණු කිරීම හා සංවර්ධනය කිරීම, පුහුණු කිරීම් සඳහා මුදල් වැය කිරීම් සහ පුහුණු ආයතනයන්ගේ මෙහෙයුම් කාර්යාවලිය සඳහා නිශ්චිත වගකීම් පවරා ඇත. විශේෂයෙන් අමාත්‍යාංශවල, දෙපාර්තමේන්තුවල, අනෙකුත් ආයතනවල පළාත් සභාවල සහ පළාත් පාලන ආයතනවල වගකීම් අමුණා ඇති ප්‍රතිපත්ති ප්‍රකාශයේ 2.1, 2.3 සහ 3 ඡේදයන් පරිදි රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ වගකීම් 2.2 සහ 3.6 ඡේදයන්හිද, පුහුණු ආයතනයන්හි වගකීම් 4.1, 4.3 සහ 4.5 හිද දැක්වේ.

03. එබැවින් මෙම ජාතික ප්‍රතිපත්තියෙහි ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම සඳහා ඔබගේ ක්‍රියාකාරී සහයෝගය සහ සම්බන්ධීකරණය ඉල්ලා සිටිනු ලැබේ.

හිල් ප්‍රනාන්දු
ලේකම්,
රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1990 පෙබරවාරි 28 දින.

2. <u>වගකීම් පැවරීම:</u>

2:1 සේවකයින් පුහුණු කිරීම එක් එක් අමාත්‍යාංශයේ, දෙපාර්තමේන්තුවේ, ආයතනයේ පළාත් සභාවේ සහ පළාත් පාලන බල මණ්ඩලයේ ප්‍රධානියාගේ මූලික වගකීම වේ.

2:2 ශ්‍රී ලංකා රාජ්‍ය සේවයේ පුහුණු කටයුතු සංවර්ධනය කිරීම, ඒකාබද්ධ කිරීම, අඛ වැඩි දියුණු කොට පහසු කරවීමෙහිලා රාජ්‍ය පරිපාලන භාර අමාත්‍යාංශය කටයුතු කරන අතර, පහත සඳහන් අයුරු ද ක්‍රියා කළ යුතුවේ.

2:2:1 පුහුණු වැඩසටහන් වැඩි දියුණු කිරීමේ හා ශක්තිමත් කිරීමේ අවශ්‍යතා පිළිබඳ ශ්‍රීමත් ජනාධිපති තුමානන්ට උපදෙස් දීම,

2:2:2 ප්‍රබල පුහුණු සැලසුම් සංවර්ධනය කොට ඒවා ඇගයීම සඳහා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන, පළාත් සභා සහ පළාත් පාලන අධිකාරිවලට උපදෙස් දීම හා සහාය වීම.

2:2:3 පුහුණු වැඩසටහන් ස්ථාපිත කිරීම, සංවර්ධනය කිරීම හා ශක්තිසම්පන්න කිරීමට අදාළව අමාත්‍යාංශවලට, දෙපාර්තමේන්තුවලට, ආයතන වලට පළාත් සභාවලට සහ පළාත් පාලන අධිකාරිවලට උපදෙස් මාලා සැපයීම.

2:2:4 පුහුණු කරුවන් පිළිබඳ සුදුසුකම්, පහසුකම් හා ශිල්පීය ක්‍රම ඇතුළු පුහුණු ප්‍රමිතීන් ස්ථාපිත කිරීම සහ ස්ථාපිත ප්‍රමිතීන් අනුව ක්‍රියා කරන බවට වග බලා ගැනීම සඳහා සුදුසු පියවර ගැනීම.

2:2:5 පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඒවා සපුරාලීම සඳහා විධිවිධාන යෙදීම.

2:2:6 පෞද්ගලික හා සමාන්තර අංශයන්හි ඇති පුහුණු සම්පත් වලින් නියමිත ප්‍රයෝජ ගැනීම සඳහා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන, පළාත් සභා හා පළාත් පාලන අධිකාරියන් දිරි ගැන්වීම සහ ඒවාට සහාය වීම.

2:2:7 පුහුණු කිරීමට අදාල පර්යේෂණ ඇරඹීම හා ඊට පහසුකම් සැලසීම හා එහි ප්‍රතිඵල බෙදාහැරීම.

2:2:8 අවශ්‍ය පරිදි නව පුහුණු ආයතන ඇති කිරීමට සහාය වීම.

2:2:9 රාජ්‍ය සේවය සම්බන්ධ සියළුම පුහුණු කටයුතු ගැන [illegible] කිරීමේ ක්‍රමයක් පිහිටුවා එම කටයුතු පවත්වාගෙන යාම.

2:2:10 ජාතික රාජ්‍ය සේවා පුහුණු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ කලින් කල වාර් ශ්‍රීමත් ජනාධිපති තුමාට ඉදිරිපත් කිරීම.

2:3 තමන්ගේ ඒ ඒ ආයතනවල කළමනාකරණ හැකියා වර්ධනය කිරීම සඳහා මෙම ප්‍රතිප ප්‍රකාශනයෙහි සඳහන් මූල ධර්ම වලට අනුකූලව එක් එක් අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව, ආයතනය, පළාත් සභාව සහ පළාත් පාලන අධිකාරිය කටයුතු සැලසුම් කොට වැඩසටහන් සම්පාදනය කොට මුදල් යොදවා එම පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කොට ඇගයීම් කරනු ඇත. ඒ සඳහා එහි ආයතන පහත සඳහන් අයුරු ක්‍රියා කරනු ඇත.

2:3:1 සේවකයන් සඳහා පුහුණු වීමේ අවස්ථා සහ ස්වයං පුහුණු කිරීම්වලට උපකාරීවන ද්‍රව්‍ය ඔවුන්ට ලබාදී ඔවුන් ස්වයං වර්ධනය කෙරෙහි නැඹුරු කරවන වැඩ පරිසරයක් ඇති කිරීමෙන් සේවකයින් ස්වයං වර්ධනය කෙරෙහි උනන්දු කරවීම.

2:3:2 සේවකයින්ගේ කාර්යයන් ඉටුකිරීමේදී නව දැනුම් හා ශක්තීන් යොදාගෙන ආයතනය පලදායි මෙහෙයක් ඉටු කිරීම සඳහා ඔවුන් දිරිපත් කරන හා ඔවුන්ට උපකාරීවන කළමනාකරණ පරිසරයක් සංවර්ධනය කිරීම.

2:3:3 ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුගේ ප්‍රධානත්වයෙන් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකයක් පිහිටුවීම. පුහුණු කිරීම් පිළිබඳ අවශ්‍යතාවන් හඳුනා ගැනීම සඳහා සහ සියළු වර්ගවලට අයත් සේවකයන් ආවරණය වන පරිදි වාර්ෂික පුහුණු සැලසුම් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම එම ඒකකයේ වගකීම වන්නේ ය.

<u>පුහුණු කිරීම් සඳහා මුදල් යෙදවීම.</u>

3:1 එක් එක් අමාත්‍යාංශයෙහි දෙපාර්තමේන්තුවෙහි ආයතනයෙහි පළාත් සභාවේ හා ඒකාබද්ධ සේවයෙහි අයවැය හි එම පුහුණුවීම් සඳහා විශේෂයෙන්ම ප්‍රතිපාදිත අරමුදල් වලින් සේවකයින්ගේ පුහුණුව සඳහා වැය කෙරෙනු ඇත.

3:2 පෞද්ගලික පඩිනඩි සඳහා එම එක් එක් ආයතනයට මුළු අයවැයෙහි ප්‍රතිශතයක් වශයෙන් එම මුදල් ප්‍රතිපාදන ගණන් බැලිය යුතු අතර, පළමු රු: දශලක්ෂයෙන් 5% ක ප්‍රමාණයෙන් ඇරඹී අඩු වීගෙන යන පරිමාණයක් පදනම් කරගෙන එතැන් සිට එක් එක් අතිරේක රුපියල් දශලක්ෂයේ ප්‍රමාණය සඳහා 2% බැගින් වූ අවම ප්‍රමාණයක් දක්වා 1% බැගින් අඩුවනු ඇත.

3:3 මුදල් මූලශ්‍රයන් නොමැතිකම හෝ ප්‍රමාණවත් නොවීම නිසා දිගුකලක් පුහුණු කිරීම් කටයුතු අපහසු කිරීමට සිදුවූ ආයතනයක් සම්බන්ධයෙන් පෞද්ගලික පඩිනඩි වලින් 5% ක් වූ උපරිම සීමාව අත්හැර දැමිය හැකි අතර, එසේ කළයුත්තේ මැනවින් සකස් කළ පුහුණු කිරීමේ සැලැස්මක් ආධාරක වශයෙන් තිබේ නම් පමණි.

3:4 අදාල ආයතනයේ සේවකයින් සහභාගි වන සියළුම දේශීය පුහුණු කාර්යයන්ට මුදල් යෙදවීම සඳහා පුහුණු කිරීමට වෙන්කළ මුදල් ප්‍රයෝජනයට ගතයුතු වේ. සේවකයන්ගේ වෘත්තීයමය ව්‍යුහයේදී අංශයක් වශයෙන් නියමු කරනු ලබන වැඩසටහන් කෙරෙහි ප්‍රමුඛත්වය දිය යුතුය.

3:5 මධ්‍යම ආණ්ඩුව විසින් පෞද්ගලික පඩිනඩි සඳහා වෙන්කරනු ලබන ප්‍රතිපාදන සීමාව ඇතුළතම පුහුණු කිරීම් සඳහා වන අරමුදල් අයත්වන බවත් අතිරේක ප්‍රතිපාදන නොදෙන බවත් පැහැදිලිවම වටහා ගතයුතුය. වැය සම්මතයන්ගෙන් ඉතිරිවීම් අඩුකිරීම මගින් පුහුණු කටයුතු සඳහා වෙන්කරන අරමුදල් ලබා ගතයුතු වන්නේ ය.

3:6 තම සේවක සංඛ්‍යාව පුහුණු කිරීම සඳහා යම් ආයතනයක් විසින් විශේෂයෙන්ම ප්‍රතිපාදිත අරමුදල් රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය නොමැතිව වෙනත් කාර්යයක් සඳහා ප්‍රයෝජනයට නොගත යුතුය.

4. පුහුණු ආයතන:

4:1 විශේෂිත දෙපාර්තමේන්තු ආයතනවලට අමතරව පහත සඳහන් ආයතන රාජ්‍ය සේවයේ පුහුණු කටයුතු සඳහා පොදු ආයතන වශයෙන් ගැනෙනු ඇත.

(අ) කළමනාකරණ ශ්‍රේණි.

1. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (ශ්‍රී.ලං.ප.ආ).
2. ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය.
3. කළමනාකරණ පිළිබඳ පශ්චාත්උපාධි ආයතනය.

(ආ) ප්‍රාදේශීය මට්ටම දක්වා කළමනාකරණ නොවන ශ්‍රේණි.

රාජ්‍ය සේවා පුහුණු ආයතනය. (රා.සේ.පු.ආ)

(ඉ) පළාත් සභාව සේවක සංඛ්‍යාව ඇතුළත උප ප්‍රාදේශීය මට්ටමේ කළමනාකරණ නොවන ශ්‍රේණි.

ග්‍රාම සංවර්ධන පුහුණු පර්යේෂණ ආයතනය. (ග්‍රා.සං.පු.ආ.අ.)

4:2 ආයතන මෙම ලැයිස්තුවට එකතු කිරීම හෝ ඉන් අඩු කිරීම කළ හැක.

4:3 පෞද්ගලික පඩිනඩි පරිපාලන වියදම් කාර්ය මණ්ඩල පුහුණු කිරීම් හා මූලධන වියදම් දැරීම සඳහා 4:1 හි සඳහන් අභ්‍යාස ආයතන සහ රාජ්‍ය සේවකයන් පුහුණු කරන සෙසු දෙපාර්තමේන්තු අභ්‍යාස/ආයතන සියල්ලටම වලට අරමුදල් ප්‍රතිපාදනය කෙරෙන අතර, එසේ සේවය ලබා ගන්නා ආයතනවල කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ වෙනත් සේවාවන් සඳහා ලැබෙන අරමුදල් වලින් සෙසු පුනරාවර්තන වියදම් දැරිය යුතුය.

4:4 විදේශීය කළමනාකරණ පුහුණු වීම් සඳහා ඉහත සඳහන් ශ්‍රී එක් එක් ආයතනය පිහිටුවීම, ව්‍යාප්ත කිරීම හා පවත්වාගෙන යාමට අදාල මූලධන වියදම් මෙහෙයවීම හා ප්‍රතිපාදන සැලැස්වීමේ මගින් රජය වෙත පැවරෙනු ඇත.

4:5 තමන්ගේම ප්‍රඥප්තිය මත පිහිටුවනු ලබන එක් එක් ආයතනයට එහි ම පාලක මණ්ඩලය පිහිටින අතර, තම කාර්ය මණ්ඩලය කළමනාකරණය කිරීමේදී එම ආයතන ස්වාතන්ත්‍රිය ව ක්‍රියා කරනු ඇත.